# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1853/47 - 2014 මාර්තු මස 14 වැනි සිකුරාදා - 2014.03.14

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# IV (ආ) වැනි කොටස - පළාත් පාලනය

## පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනත යටතේ දැන්වීම්

### පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනත

10අ(1)(අ) වැනි වගන්තිය යටතේ දැන්වීම

**නාරම්මල ප්‍රාදේශීය සභාව**

නාරම්මල ප්‍රාදේශීය සභාවේ සභිකයකු වන ආර්. එස්. දිනපූර්ණ මහතා, එක්සත් ජාතික පක්ෂයේ සාමාජිකයකුව සිටීම අවසන් කර ඇති නිසා එම සභාවේ ඔහුගේ සභික ධූරය ඔහු විසින් අත හැර ඇති බව නාරම්මල ප්‍රාදේශීය සභාවේ තේරීම්භාර නිලධාරී තලංගම අප්පුහාමිලාගේ චමින්ද නාමල් තලංගම වන මම, (262 වැනි අධිකාරය වූ) පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ 10අ(1)(අ) වැනි වගන්තිය යටතේ මෙයින් ප්‍රකාශ කරමි.

ටී. ඒ. සී. එන්. තලංගම,
තේරීම්භාර නිලධාරී,
නාරම්මල ප්‍රාදේශීය සභාව.

2014 මාර්තු මස 13 වැනි දින,
මැතිවරණ කාර්යාලය,
කුරුණෑගල.

03 - 995

---

### පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනත

10අ(1)(අ) වැනි වගන්තිය යටතේ දැන්වීම

**පන්නල ප්‍රාදේශීය සභාව**

පන්නල ප්‍රාදේශීය සභාවේ සභිකයකු වන රණසිංහ ආරච්චිලාගේ තුෂාර සම්පත් රණසිංහ මහතා, එක්සත් ජාතික පක්ෂයේ සාමාජිකයකුව සිටීම අවසන් කර ඇති නිසා එම සභාවේ ඔහුගේ සභික ධූරය ඔහු විසින් අත හැර ඇති බව පන්නල ප්‍රාදේශීය සභාවේ තේරීම්භාර නිලධාරී තලංගම අප්පුහාමිලාගේ චමින්ද නාමල් තලංගම වන මම, (262 වැනි අධිකාරය වූ) පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ 10අ(1)(අ) වැනි වගන්තිය යටතේ මෙයින් ප්‍රකාශ කරමි.

ටී. ඒ. සී. එන්. තලංගම,
තේරීම්භාර නිලධාරී,
පන්නල ප්‍රාදේශීය සභාව.

2014 මාර්තු මස 13 වැනි දින,
මැතිවරණ කාර්යාලය,
කුරුණෑගල.

03 - 996

1A - G 19261 — 95 (2014/03)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

**2013 අංක 30 දරන පළාත් පාලන ආයතනවල පුරප්පාඩු පිරවීමේ (විශේෂ විධිවිධාන) පනතින් සංශෝධිත (262 වැනි අධිකාරය වූ) පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ 65අ(1) වගන්තිය යටතේ අලව්ව ප්‍රාදේශීය සභාවේ උප සභාපති ධූරයේ පුරප්පාඩුව පිරවීම**

උප සභාපති, සභාපති ධූරයට පත් වීම හේතු කොට ගෙන අලව්ව ප්‍රාදේශීය සභාවේ උප සභාපති ධූරය පුරප්පාඩු වී ඇති හෙයින් ද ;

ඉහත කී ආඥාපනතේ 65අ (1) වැනි වගන්තිය යටතේ, උප සභාපති වන පතිරාජ මුදියන්සේලාගේ පුංචි බණ්ඩාර පතිරාජ වැත්තෑව නම් වූ උපසභාපති අයත් වන්නාවූ එක්සත් ජනතා නිදහස් සන්ධානය නම් වන පිළිගත් දේශපාලන පක්ෂයේ ලේකම්ට, දින තිහ (30) ක කාල පරිච්ඡේදයක් ඇතුළත උප සභාපති වශයෙන් තෝරා පත් කර ගනු ලැබිය යුතු යයි ප්‍රකාශ කරනු ලැබිය යුතු වූද ඒ පක්ෂයට අයත් වන්නාවූද, ඒ අලව්ව ප්‍රාදේශීය සභාවේ සභිකයා පිළිබඳව තීරණය කිරීමට, මා විසින් නියම කරනු ලැබ ඇති හෙයින් ද ;

ඉහත කී පිළිගත් දේශපාලන පක්ෂයේ ලේකම්, නිශ්චිත කාල පරිච්ඡේදය ඇතුළත ස්වකීය තීරණය දැනුම් නොදී ඇති හෙයින් ද ;

අලව්ව ප්‍රාදේශීය සභාවේ තේරීම්භාර නිලධාරි තලංගම අප්පුහාමිලාගේ චමින්ද නාමල් තලංගම වන මම, 2013 අංක 30 දරන පළාත් පාලන ආයතනවල පුරප්පාඩු පිරවීමේ (විශේෂ විධිවිධාන) පනතින් සංශෝධිත (262 වැනි අධිකාරය වූ) පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ 65අ (1) වැනි වගන්තිය ප්‍රකාර ක්‍රියා කරමින්, 2011 මාර්තු මස 17 වැනිදින අලව්ව ප්‍රාදේශීය සභාව සඳහා පැවැත්වූ ඡන්ද විමසීමේ දී ඊළඟට වැඩිම මනාප සංඛ්‍යාව ලබා ගත් ආරච්චිලාගේ ධර්මසිරි රත්නායක මහතා ඒ පුරප්පාඩුව ඇති වූ අලව්ව ප්‍රාදේශීය සභාවේ උප සභාපති වශයෙන් තෝරා පත්කර ගත් බව මෙයින් දැන් ප්‍රකාශ කරමි.

ටී. ඒ. සී. එන්. තලංගම,
තේරීම්භාර නිලධාරී,
අලව්ව ප්‍රාදේශීය සභාව.

2014 මාර්තු මස 06 වැනි දින,
මැතිවරණ කාර්යාලය,
කුරුණෑගල.

03 - 997

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.